මහනුවර මහා නගර සභාව

මහනුවර දිස්ත්‍රික්කය

--------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

---------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 07 දින සභාවට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට මහනුවර මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ දී පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු ට්‍රැක්ටර් ට්‍රේලර් 02 හි වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මිල දී ගෙන තිබුණු රු.769,498 ක් වටිනා යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ හා කාර්යාල උපකරණ විෂයයන් 07 ක් රු.130,962 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන්, ස්ථාවර වත්කම් රු.638,536 කින් අඩුවෙන් දක්වා තිබුණු අතර, රු.45,136 ක වටිනාකමකට මිල දී ගෙන තිබුණු වත්කම් විෂයයන් 03 ක් රු.2,711,468 ක් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන්, ස්ථාවර වත්කම් රු.2,666,332 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) 2016 භාණ්ඩ සමීක්ෂණයෙන් අපහරණය කිරීමට නිර්දේශ ලබා දී තිබුණු රු.1,535,119 ක් වටිනා ස්ථාවර වත්කම් විෂයයන් 167 ක් 2018 අගෝස්තු වන විටත් අපහරණය කර නොතිබිය දී, සමාලෝචිත වර්ෂයේ ගිණුම්වලින් එම වටිනාකම ඉවත් කර තිබුණි.

(ඈ) වටිනාකම හඳුනාගත නොහැකි ගිනි රථයක් සමාලෝචිත වර්ෂය තුළ දී රු.291,160 ක වටිනාකමකට වෙන්දේසි කර තිබුණ ද, එහි පිරිවැය ගිණුම්වලින් ඉවත් කර නොතිබුණි.

(ඉ) 2010 පෙබරවාරි 04 දින සිට නාගරික කාර්මික වැඩපලෙහි නිෂ්ක්‍රීයව පැවති රු.65,000 ක් වටිනා මෝටර් සයිකලයක් වෙන්දේසි කර වටිනාකම ගිණුම්වලින් ඉවත් කිරීමේ දී, රු.165,000 ක් ලෙස මෝටර් රථ ගිණුමට බැර කර තිබීම හේතුවෙන්, ස්ථාවර වත්කම් රු.100,000 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) මැණික්කුඹුර තොග හා සිල්ලර වෙළඳ සංකීර්ණවලට අදාළ කඩ කුලී ලේඛන අනුව, සමාලෝචිත වර්ෂයේ ආදායම රු.5,034,660 ක් වුවත්, රු.5,305,268 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන්, වර්ෂයේ ආදායම රු.270,608 කින් වැඩිපුර දක්වා තිබුණි.

(උ) වෙළඳ සංකීර්ණ 17 ක කඩ කාමර 857 ක සමාලෝචිත වර්ෂයට අදාළ කඩ කුලී ආදායම රු.53,757,607 ක් වුවත්, එය රු.55,628,750 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන්, කඩ කුලී ආදායම රු.1,871,143 කින් වැඩිපුර දක්වා තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂය තුළ ටෙන්ඩර් කර බදු දී තිබූ මධ්‍යම වෙළඳපොළ මස් කඩ 02 කට අදාළ ටෙන්ඩර් ගාස්තු ආදායම රු.3,809,000 ක් සමාලෝචිත වර්ෂයේ ආදායමක් සේ ගිණුම්ගත කර නොතිබුණි.

(එ) ඉකුත් වර්ෂයේ අවසාන දින දක්වා ගබඩාවෙන් නිකුත් කර තිබුණු රු.12,428,694 ක් වටිනා ගබඩා ද්‍රව්‍ය සමාලෝචිත වර්ෂයේ වියදමක් සේ ගිණුම්ගත කිරීමෙන් වියදම් එම වටිනාකමින් වැඩිපුර දක්වා තිබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂය තුළ නිරවුල් කරන ලද එකතු වටිනාකම රු.12,127,946 ක් වූ පොදු තැන්පත් ගනුදෙනු තැන්පත් ගිණුමට රු.12,387,747 ක් ලෙස හර කිරීම හේතුවෙන්, පොදු තැන්පත් රු.259,801 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඕ) 2017 ජනවාරි 01 දිනට හිඟ ජල ගාස්තුව රු.95,685,642 ක් වුවත්, එය රු.100,906,507 ක් ලෙස ගිණුම්වල දැක්වීම හේතුවෙන්, 2017 ජනවාරි 01 දිනට හිඟ ශේෂය රු.5,220,865 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ක) ජල කර්මාන්ත දෙපාර්තමේන්තුවේ තොරතුරුවලට අනුව, සමාලෝචිත වර්ෂයට අදාළ ජල ගාස්තු බිල් කළ ආදායම රු.436,769,100 ක් වුවත්, එය රු.402,055,179 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන්, ආදායම් රු.34,713,921 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ග) ඉකුත් වර්ෂයට අදාළව සමාලෝචිත වර්ෂයේ ලැබී තිබුණු රු.444,480 ක ත්‍රී රෝද රථ ගාස්තු සමාලෝචිත වර්ෂයේ ආදායමක් සේ සලකා ගිණුම්ගත කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයට අදාළව ලැබිය යුතු ත්‍රී රෝද රථ ගාස්තු රු.23,372,709 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ච) ඉකුත් වර්ෂය වෙනුවෙන් රු.5,521,782 ක උසාවි දඩ මුදල් සමාලෝචිත වර්ෂයේ ලැබී තිබුණද, ආරම්භක ශේෂය ලෙස රු.3,385,567 ක් පමණක් ගිණුම්වල දක්වා තිබුණි. මේ හේතුවෙන්, ආරම්භක ශේෂය රු.2,136,215 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඡ) සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර්, නොවැම්බර් හා දෙසැම්බර් මාස සඳහා ලැබිය යුතු උසාවි දඩ මුදල් රු.1,269,304 ක් ලැබිය යුතු ආදායම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ට) උසාවි දඩ ලේඛනය අනුව, සමාලෝචිත වර්ෂයේ බිල් කිරීම් රු.11,021,707 ක් වුවත්, ගිණුම්වල රු.13,020,493 ක් ලෙස දක්වා තිබීමෙන් වර්ෂයේ ආදායම රු.1,998,786 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඩ) මහනුවර වැවේ බෝට්ටු සේවාව පවත්වා ගෙන යාම බදු දීම වෙනුවෙන් ඉදිරි වර්ෂය සඳහා ලැබී තිබූ රු.218,257 ක බදු මුදල් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ණ) වැසිකිළි බදු දීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයට අදාළ ආදායම රු.8,984,448 ක් වුවත්, එය රු.8,920,410 ක් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන්, ආදායම රු.64,038 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ත) වැසිකිළි බදු දීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ලැබී තිබූ ඉදිරියට ලැබීම් රු.9,820,259 ක් වුවත්, එය රු.19,163,162 ක් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන්, ඉදිරියට ලැබීම් රු.9,342,903 කින් වැඩියෙන් දක්වා තිබුණි.

1.3.2 නොසැසඳුණු ගිණුම්
-----------------------

ගිණුම් විෂයයන් 08 කට අදාළ මූල්‍ය ප්‍රකාශන අනුව, ශේෂයන්ගේ එකතුව රු.827,525,152 ක් වූ අතර, ඊට අදාළ ලේඛන හා උපලේඛන අනුව එකතුව රු.661,861,771 ක් වූයෙන්, රු.165,663,381 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) ලැබිය යුතු ගිණුම්

2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 10 ක එකතු වටිනාකම රු.549,611,810 ක් වූ අතර, එයින් වර්ෂ 01 ත් 05 ත් අතර කාලයක සිට පැවත එන ගිණුම් ශේෂ එකතුව රු.90,871,720 ක් විය. එසේම, වර්ෂ 05 ක් ඉක්මවා තිබුණු ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.244,167,359 ක් විය. 2018 අගෝස්තු 24 දිනට රු.448,369,519 ක ශේෂයක් තවදුරටත් අය විය යුතුව පැවතුණි.

(ආ) ගෙවිය යුතු ගිණුම්

2017 දෙසැම්බර් 31 දිනට පැවති ණයහිමි ශේෂ 03 ක එකතු වටිනාකම රු.992,436,957 ක් වූ අතර, එයින් වර්ෂ 01 ත් 05 ත් අතර කාලයක සිට පැවත එන ගිණුම් ශේෂවල එකතුව රු.90,462,557 ක් විය. 2018 අගෝස්තු 24 දිනට රු.556,710,571 ක ශේෂයක් තවදුරටත් ගෙවිය යුතුව පැවතුණි.

1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා, එකතුව රු.1,191,692,284 ක් වූ ගිණුම් විෂයයන් 13 ක් විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

(ආ) පරීක්ෂණ අවස්ථාවේ ලබා දී තිබුණු සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ හිටි රු.123,552,618 ක වරිපනම් හා හිඟ හිටි රු.118,832,877 ක ජල ගාස්තු පිළිබඳ කාල විශ්ලේෂණය පරිගණක මෘදුකාංගයෙන් ලබාගත නොහැකි විය.

1.3.5 අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම<br>රු | අනුකූල නොවීම |
|---|---|---|---|
| (අ) | මහා නගර සභා ආඥා පනතේ 247(අ)(1) වගන්තිය | 681,003 | මහා නගර සභා සීමාව තුළ සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි හෝටල්වල බදු හා සේවා ගාස්තු අඩු කිරීමෙන් පසු ආදායමෙන් බලපත්‍ර ගාස්තු අයකර තිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2003 සැප්තැම්බර් 05 දිනැති අංක 1304/18 දරන මහනුවර මහා නගර සභා අතුරු ව්‍යවස්ථාවේ iv වන කොටසේ ගබඩා පිළිබඳ රීති 36 | - | මධ්‍යම ගබඩාව, ජල ගබඩාව හා ආයුර්වේද ඖෂධ ගබඩාවේ 2017 වර්ෂයට අදාළව සමීක්ෂණ වාර්තා 2018 ජුලි 18 දින වනවිටත් ඉදිරිපත් කර නොතිබුණි. එසේම සමීක්ෂණ වාර්තාවේ සඳහන් වර්ෂ 07 කටත් අධික කාලයක සිට හඳුනා ගත් වෙනස්කම් නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදය | | |
| (i) | 03 වන ඡේදය | - | සභාව සතු නිවාස 67 ක් ඒවා ලැබීමට සුදුසුකම් ඇති නිලධර පන්තිවලට අනුව ශ්‍රේණිගත කර නොතිබුණි. |
| (ii) | 4.3.4 ඡේදය | - | එක් එක් නිවාස ශ්‍රේණිය සඳහා වෙනම පොරොත්තු ලේඛන පවත්වා නොගෙන සභාවේ සියලුම නිලධාරීන් හා සේවකයින් සඳහා එක් පොරොත්තු ලේඛනයක් නඩත්තු කර තිබුණි. |
| (iii) | 6.1 ඡේදය | - | සභාව සතු පොදු නිවාස 05 ක නිලධාරීන් හා සේවකයින් 05 දෙනෙකු වර්ෂ 05 ත් වර්ෂ 28 ත් අතර කාල පරාසයක සිට පදිංචි වී තිබුණි. |
| (iv) | 8.1 හා 8.2 ඡේද | - | රජයේ නිවාස 69 ක විදුලි උපකරණ, අනෙකුත් උපකරණ සහ ඉබි යතුරු යනාදිය පිළිබඳව ඉන්වෙන්ට්‍රියක් නඩත්තු කර නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| (i) | 1645(අ) | - | වාහන 154 ක් සඳහා ලොග් සටහන් පොත් පවත්වා ගෙන ගොස් නොතිබුණි. |
| (ii) | 1645(ඇ) | 234,665 | පරීක්ෂාවට භාජනය වූ වාහන දෙකක 2017 පෙබරවාරි සිට අගෝස්තු දක්වා කාලය තුළ ධාවන සටහන්වල ගමන් පිළිබඳ විස්තර ඇතුළත් කර නොතිබුණි. එම කාලය තුළ කි.මී.6,092 ක් ධාවනය කර ඒ සඳහා වියදම් දරා තිබුණි. |

| | | | |
|---|---|---|---|
| (iii) | මු.රෙ.1647(අ) | - | වාහන 76 කට අදාළ ලොග් පොත්වල අවශ්‍ය සටහන් තබා නිසි පරිදි නඩත්තු කර නොතිබුණි. |
| නී ති , | | | |
| (ඉ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | -- | පරිගණක හා පරිගණක උපාංග සම්බන්ධයෙන් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |
| (ඊ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.12 මාර්ගෝපදේශය | -- | වැට් බදු ආවරණය කිරීම සඳහා මුදල් ගෙවීමෙන් පසු, ඒ බව දේශීය ආදායම් කොමසාරිස්වරයා වෙත දැනුම් දීමේ දී, ඊට අදාළ තොරතුරුවල පිටපත් විගණකාධිපතිවරයා වෙත යොමු කර නොතිබුණි. |
| (උ) | පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛ | | |
| (i) | 2011 ඔක්තෝබර් 14 දිනැති අංක 2/2011 චක්‍රලේඛය | 66,571,614 | 2017 වර්ෂය තුළ දී සෘජු ශ්‍රමය යටතේ ක්‍රියාත්මක කර තිබූ කර්මාන්ත 60 කට අදාළව නිකුත් කර තිබූ වැඩ පත්‍රිකාවල ද්‍රව්‍ය හා ශ්‍රම ඇස්තමේන්තු, ඉටු කළ වැඩ සඳහා අනුමැතිය හා නිර්දේශ යනාදිය සම්පූර්ණ කර නොතිබුණි. |
| (ii) | 2014 මාර්තු 20 දිනැති අංක 2014/2 දරන චක්‍රලේඛයේ 03 ඡේදය | 60,421,000 | සමාලෝචිත වර්ෂයේදී රු.1,871,312,000 ක් වූ මුළු පුනරාවර්තන වියදමින් අලුත්වැඩියා හා නඩත්තු කටයුතු සඳහා සියයට 50 ක් වෙන් කළ යුතු වුවත්, වෙන් කර තිබූ මුදල සියයට 03 ක් තරම් අඩු ප්‍රතිශතයක් විය. |

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.520,473,900 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.518,109,683 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

----------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) නිකුත් කළ නමුත්, ගෙවීමට ඉදිරිපත් නොකළ චෙක්පත් ලෙස බැංකු සැසඳුම්වල දක්වා තිබූ රු.72,098 ක් වටිනා චෙක්පත් 14 ක් ආදායකයාට නිකුත් කිරීමකින් තොරව 2018 අගෝස්තු වනවිටත් විෂයය භාර නිලධාරිණිය භාරයේ රඳවා ගෙන තිබුණි.

(ආ) 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ තැන්පත් කළ නමුත්, උපලබ්ධි නොවූ රු.87,150 ක් වටිනා චෙක්පත් හා මුදල් ඇණවුම් 18 ක් සම්බන්ධව සොයා බලා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) බැංකු ගිණුම් 02 කට අදාළව බැංකුවේ සෘජු බැර ලෙස දක්වා තිබූ රු.929,098 ක් වටිනා හඳුනා නොගත් බැංකු තැන්පත් 15 ක් හඳුනා ගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) බැංකු ගිණුම් 02 ට අදාළව බැංකුවට සෘජු හර කිරීම් ලෙස දක්වා තිබූ රු.112,101 ක් වූ විෂයයන් 11 ක් හඳුනා ගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) බැංකු ගිණුම් සඳහා 2015 වර්ෂයේ අවස්ථා 02 කදී, සෘජු බැර ලෙස ලැබී තිබූ රු.114,595 ක් 2018 ජූලි 31 දින වන විටත් හඳුනා ගැනීමට කටයුතු කිරීමකින් තොරව තැන්පතු ගිණුමේ රඳවා ගෙන තිබුණි.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 839,543,000 | 951,640,588 | 821,071,501 | 285,599,883 | 320,000,000 | 290,791,296 | 292,332,768 | 100,380,560 |
| (ii) | කුලී | 116,533,000 | 65,179,198 | 67,087,038 | 62,046,007 | 105,501,000 | 67,870,036 | 74,907,290 | 98,906,302 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 46,495,000 | 31,227,877 | 31,227,877 | -- | 36,331,000 | 30,459,082 | 30,459,082 | -- |
| (iv) | වෙනත් ආදායම් | 576,462,000 | 476,941,161 | 322,459,698 | 424,389,671 | 1,359,327,000 | 474,772,898 | 564,743,177 | 258,256,640 |
| | එකතුව | 1,579,033,000 | 1,524,988,824 | 1,241,846,114 | 772,035,561 | 1,821,159,000 | 863,893,312 | 962,442,317 | 457,543,502 |

### 2.3.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

සමස්ත ආදායම් ප්‍රභවයන්ගෙන් 2016 දෙසැම්බර් 31 දිනට පැවති හිඟය රු.457,543,502 ක් වූ අතර, සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට එම වටිනාකම රු.772,035,561 ක් වීම හේතුවෙන්, හිඟ ආදායම්වල වර්ධනය සියයට 59 ක් විය.

### 2.3.3 වරිපනම් හා බදු

(අ) වරිපනම්

2017 ජනවාරි 01 දිනට හිඟ වරිපනම් ශේෂය රු.127,529,521 ක් වූ අතර, 2017 දෙසැම්බර් 31 දින දක්වා බිල් කිරීම් රු.317,493,192 ක් විය. 2017 දෙසැම්බර් 31 දින වන විට හිඟයෙන් හා බිල් කිරීමෙන් අය කර තිබුණේ පිළිවෙළින් රු.73,178,018 ක් හා රු.238,141,102 ක් පමණි. මෙය සියයට 57 ක් සහ සියයට 75 ක් විය. 2017 දෙසැම්බර් 31 දිනට රු.133,703,593 ක හිඟ ශේෂයක් පැවති අතර, 2018 මාර්තු 31 දින වන විට රු.87,119,124 ක් තවදුරටත් අය විය යුතුව පැවතුණි.

(ආ) ඉඩම් බදු

2017 ජනවාරි 01 දිනට හිඟ ඉඩම් බදු ශේෂය රු.34,952,454 ක් වූ අතර, 2017 දෙසැම්බර් 31 දින වන විට එම ශේෂයෙන් රු.1,917,383 ක් පමණක් අය කර තිබුණි. බදු අය කර ගැනීම සියයට 05 ක් වූ අතර, ඉඩම් බදු හිඟ ශේෂ අයකර ගැනීම ඉතා දුර්වල මට්ටමක පැවතුණි.

2.3.4 කුලී

-----

2017 ජනවාරි 01 දිනට හිඟ කුලී ශේෂය රු.62,601,539 ක් වූ අතර, 2017 දෙසැම්බර් 31 දින දක්වා බිල් කිරීම් රු.62,403,253 ක් විය. 2017 දෙසැම්බර් 31 දින වන විට හිඟයෙන් හා බිල් කිරීමෙන් අය කර තිබුණේ පිළිවෙළින් රු.27,103,002 ක් හා රු.37,095,686 ක් පමණි. මෙය සියයට 43 ක් සහ සියයට 59 ක් වූ අතර, 2017 දෙසැම්බර් 31 දිනට රු.60,806,104 ක හිඟ ශේෂයක් පැවතුණි. මේ අනුව, කුලී අය කර ගැනීම දුර්වල මට්ටමක පැවති අතර, 2018 ජූනි 30 දින වනවිට රු.47,853,462 ක් තවදුරටත් අයවිය යුතුව තිබුණි.

2.3.5 වෙනත් ආදායම්

-------------------

ත්‍රී රෝද රථ ගාස්තු

----------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2017 ජනවාරි 01 දිනට හිඟ ත්‍රී රෝද රථ ගාස්තු රු.16,922,789 ක් වූ අතර, 2017 දෙසැම්බර් 31 දින වන විට එම ශේෂයෙන් අය කර තිබුණේ රු.444,480 ක් පමණි. හිඟ ගාස්තු අය කිරීම සියයට 02 ක් වූයෙන්, හිඟ ත්‍රී රෝද රථ ගාස්තු අය කර ගැනීම ඉතා දුර්වල මට්ටමක පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා ත්‍රී රෝද රථ සමීක්ෂණයක් සිදු කර නොතිබුණි.

2.3.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු

------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.5,965,152 ක් හා මුද්දර ගාස්තු රු.177,948,417 ක් විය. 2018 ජූනි 30 දින වනවිට මුද්දර ගාස්තු රු.141,327,627 ක් පමණක් තවදුරටත් අය විය යුතුව තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

3.1 කාර්යසාධනය

-----------------

මහා නගර සභා ආඥා පනතේ 04 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අපේක්ෂිත අරමුණු ඉටු නොකිරීම

--------------------------------------

වීථිවල රථ වාහන නවතා තැබීම පාලනය කිරීම සඳහා වීථිවල වැඩි වේලාවක් නවතා තබන වාහනවලින් වැඩි ගාස්තුවක් අයකිරීම සඳහා පෞද්ගලික ආයතනයකට බදු දී තිබුණි. එහෙත්, ගාස්තු අය කිරීමකින් තොරව දවස මුළුල්ලේ වීථිවල නවතා තැබීමට ඉඩ දීමෙන් එම අරමුණු ඉටු වී නොතිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්ම

---------------------

නාගරික ආයුර්වේද දෙපාර්තමේන්තුවේ 2017 වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම අනුව, නාගරික ජනතාව සඳහා ඖෂධ සහන මිලට අළෙවි කිරීම සඳහා නවීන යන්ත්‍රෝපකරණ සහිත ඖෂධ නිෂ්පාදනය ආරම්භ කර ඇති බව සඳහන්ව ඇතත්, නිලධාරී හිඟය හා ප්‍රමාණවත් අධීක්ෂණයක්

නොමැතිවීම මත ඖෂධ නිෂ්පාදනය ප්‍රමාණාත්මකව සිදු වී නොතිබුණි. බොහෝ ඖෂධ වර්ග 2014, 2015, 2016 හා 2017 වර්ෂවලින් පසුව නිෂ්පාදනයක් වී නොතිබුණි.

(ඈ) ඉටු නොකළ කාර්යයන්

---------------------------

ආයුර්වේද දෙපාර්තමේන්තුවේ සේවකයින් සඳහා 2017 වාර්ෂික අයවැය ලේඛනය මඟින් නිල ඇඳුම් සඳහා රු.500,000 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණ ද, 2017 දෙසැම්බර් 31 දින වන විට එම ප්‍රතිපාදනවලින් සියයට 94 ක් වැය කර නොතිබුණි.

(ඈ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

----------------------------------

දිරන කසළ යොදා ගනිමින් කොම්පෝස්ට් නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.4,000,000 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් රු.3,948,447 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි.

(ඉ) තිරසර සංවර්ධන ඉලක්ක

-----------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමට අදාළ විය හැකි අභ්‍යන්තර චක්‍රලේඛ හා මඟ පෙන්වීම් පිළියෙල කර නොතිබුණි.

(ii) තිරසර සංවර්ධන වැඩසටහන් යටතේ ක්‍රියාත්මක කළ බවට දක්වා තිබුණු බොහෝමයක් වැඩසටහන් සභාව ඊට පෙර සිට ක්‍රියාත්මක කරමින් පැවති වැඩසටහන් විය.

(ii) වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා කාර්ය මණ්ඩලය යොදවා ගැනීමේ ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) මහනුවර නගරයේ ඩිජිටල් දැන්වීම් තිර පවත්වා ගෙන යාම සඳහා පෞද්ගලික ආයතනයක් සමඟ වූ එකඟතාවය අනුව, එකවර අය කළ යුතු රු.500,000 ක් හා ඉතිරි රු.1,500,000 ක් වාරික 24 කින් අයකර ගැනීමට 2017 දෙසැම්බර් 31 දින වනවිටත් කටයුතු කර නොතිබුණි.

(ආ) අස්ගිරිය නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ වෛද්‍ය ප්‍රතිකාර සඳහා රෝගීන් වෙත නිකුත් කළ යුතු බෙහෙත් ද්‍රව්‍ය වර්ග 31 ක් වර්ෂ 01 ත් 05 ත් අතර කාලයක ලැබී නොතිබුණි.

(ඇ) 2017 අගෝස්තු ඇසළ මේලා සැණකෙළි දිනයන් හී මුද්‍රා නොතබන ලද අංක රහිත ව්‍යාජ ප්‍රවේශ පත්‍ර නිකුත් කර තිබුණු බව ආදායම් පරීක්ෂක නිලධාරීන් වාර්තා කර තිබුණ ද, ඒ පිළිබඳ කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඈ) මහනුවර මහ රෝහලට අයත් බෝගම්බර ලය චිකිත්සාගාරය ඉදිරිපිටින් ගමන් කරන පටු ජනාකීර්ණ මාර්ගය දෙපස සති පොළක් ස්ථානගත කිරීමෙන්, නේවාසික රෝගීන්ට හා රෝහලට ගමන් කරන රෝගීන්ට අපහසුතා සිදු වී තිබුණු අතර, නගරයේ අධික වාහන තදබදය තවදුරටත් වර්ධනය වීමට හේතු වී තිබුණි.

3.3 මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට සභාවේ පුරප්පාඩු තනතුරු 163 ක් හා අතිරික්ත තනතුරු 04 ක් පැවතුණි. අනියම්/ ආදේශක 136 දෙනෙකු සේවයෙහි යොදවා තිබුණි.

(ආ) 1994 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදය තුළ විශ්‍රාම ගිය, සේවය අත හැර ගිය, වැඩ තහනම් කළ සහ ස්ථාන මාරු වී ගිය නිලධාරීන් හා සේවකයින් 282 දෙනෙකුගෙන් අයවිය යුතු ණය ශේෂය රු.19,018,526 ක් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-----------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය තුළ කොම්පෝස්ට් බඳුන් අළෙවි කිරීමෙන් ලැබී තිබූ රු.582,505 ක ආදායමක් තැන්පතු ගිණුමේ රඳවා ගෙන තිබුණි.

(ආ) නිශ්චිත කාර්යයක් වෙනුවෙන් විවිධ පාර්ශවයන්ගෙන් අවස්ථා 06 කදී ලැබී තිබූ රු.2,418,657 ක් අදාළ කාර්යයන් සඳහා යොදා ගැනීමකින් තොරව තැන්පතු ගිණුමේ රඳවා ගෙන තිබුණි.

(ඇ) සභා බල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු පොදු ප්‍රවේශ මාර්ගයක් අවහිර වන ලෙස නිවසක් ඉදිකර තිබුණු අතර, එම අනවසර ඉදිකිරීම් ඉවත් කරන ලෙස නගර සභාව හා අධිකරණය විසින් 2005 වර්ෂයේ සිට නියෝග නිකුත් කර තිබුණි. ඊට අනුකූල නොවූ ඉහත පදිංචිකරු පිළිබඳව විෂය භාර අමාත්‍යවරයාට තොරතුරු වැරදි ලෙස දක්වා සභාවට අයත් කලාප කාර්යාලයක් පිහිටි භූමියෙන් ඉහත නිවසට ප්‍රවේශ මාර්ගයක් ලබා ගැනීමට ඉඩ හැර තිබුණි.

3.5 වත්කම් කළමනාකරණය

-----------------------------

3.5.1 නිෂ්ක්‍රීය/ ඌන උපයෝජිත වත්කම්

--------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) රු.235,361 ක් වටිනා ජල නළ හා උපාංග අයිතම 10 ක් හා වටිනාකම ගණනය කළ නොහැකි ජල නළ හා උපාංග අයිතම 21 ක් 1980 වර්ෂයේ සිට භාවිතයට ගැනීමකින් තොරව ජල ගබඩාවේ නිෂ්ක්‍රීයව පැවතුණි.

(ආ) ජල නළ ව්‍යාපෘතියක් නිම වීමෙන් පසු සභාව වෙත භාර දී තිබුණු ලේඛනගත කර නොතිබුණු ජල නළ උපාංග 300 ක් හා වෙනත් විවිධ ජල නළ උපාංග 144 ක් පරිහරණයට ගැනීමකින් තොරව ගබඩා කර තිබුණි.

(ඇ) භාවිතයෙන් ඉවත් කර විවිධ ඒකකවලින් භාර දී තිබුණු හා ජල ගබඩාවේ භාවිතයෙන් ඉවත් කර තිබුණු ජල නළ උපාංග 167 ක් අපහරණය කිරීමකින් තොරව ගබඩා කර තිබුණි.

(ඇ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ අංශයට අයත් ධාවන තත්ත්වයේ පවතින රු.4,243,700 ක් වටිනා ගලි රථයක් හා ජල පවිත්‍රාගාරයට අයත් රු.2,160,000 ක් වටිනා ජල බවුසරයක් මාස 06 කට අධික කාලයක සිට නිෂ්කාර්යව ජල පවිත්‍රාගාර පරිශ්‍රයේ එළි මහනේ දිරා පත්වීමට ඉඩ හැර තිබුණි. ගලි රථය අභාවිතව පැවති කාලය තුළ රු.79,690 ක් වැය කර අමතර කොටස් යොදා නාගරික යාන්ත්‍රික ඉංජිනේරුවරයාගේ අධීක්ෂණයකින් තොරව අලුත්වැඩියා කර තිබුණි.

(ඉ) වර්ෂ 05 කට පෙර ගලවා ඉවත් කරන ලද ප්‍රිම්රෝස් (මොනෝ) පොම්ප 02 ක් හා වර්ෂ ගණනාවකට පෙර භාවිතයෙන් ඉවත් කර තිබූ DI හා CI වර්ගයේ ජල නළ හා උපාංග විශාල

තොගයක් අපහරණය කිරීමෙන් තොරව 2018 ජූලි 31 දින වනවිටත් ජල පවිත්‍රාගාර භූමියේ ගොඩ ගසා තිබුණි.

(ඊ) සභාවේ මහජනාධාර හා සුභසාධක දෙපාර්තමේන්තුවට අයත් ගෑස් ලිප්, ගෑස් සිලින්ඩර්, මහන මැෂින් ඇතුළු භාණ්ඩ ඒකක 37 ක් භාවිතයට ගැනීමට හෝ සුදුස්සක් කිරීමට කටයුතු කිරීමකින් තොරව 2009 වර්ෂයට පෙර සිට මහයියාව මැහුම් මධ්‍යස්ථාන ගොඩනැගිල්ලේ ගබඩා කර තිබුණි. එසේම, කිසිදු භාණ්ඩ සමීක්ෂණයකට භාජනය කර නොතිබුණු මෙම තොග ලේඛනගත කර ද නොතිබුණි.

(උ) මහයියාව මැහුම් මධ්‍යස්ථානය වෙත 2010 වර්ෂයේ පරිත්‍යාගයක් ලෙස ලැබී තිබුණු ඕවර්ලොග් මැෂින් 02 ක් හා ජූකි මැෂිමක් භාවිතයට ගැනීමකින් තොරව ඇසුරුම් ද සහිතව 2018 ජූලි 31 දින වන විටත් අදාළ මධ්‍යස්ථානයේ විනාශ වීමට ඉඩ හැර තිබුණි.

(ඌ) පොලිතීන් ප්‍රතිචක්‍රීකරණය වෙනුවෙන් යොදා ගත හැකි කම්පැක්ටර් යන්ත්‍රය 2014 වර්ෂයේ මධ්‍යම පරිසර අධිකාරියෙන් ලබා දී තිබුණ ද, එදින සිට 2018 අගෝස්තු වනවිටත් අදාළ කාර්යය සඳහා යොදා ගැනීමකින් තොරව ගොහාගොඩ කසළ අංගනයේ නිෂ්කාර්යයව පැවතුණි.

3.5.2 වාර්ෂික භාණ්ඩ/ තොග සමීක්ෂණය

---------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සුව පියස අළෙවි සැළ, පංචකර්ම ඒකකය, ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාරය හා ආයුර්වේද බෙහෙත් ශාලා 10 හි වාර්ෂිකව පැවැත්විය යුතු තොග සමීක්ෂණ වර්ෂ ගණනාවක සිට පවත්වා නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට පැවති ලිපි ද්‍රව්‍ය තොග භෞතිකව පරීක්ෂා කර සමීක්ෂණ මණ්ඩල වාර්තා පිළියෙල නොකිරීම හේතුවෙන්, මූල්‍ය ප්‍රකාශනවල දක්වන ලද රු.9,638,849 ක ලිපි ද්‍රව්‍ය තොගයෙහි නිවැරදිතාවය තහවුරු නොවුණි.

3.5.3 වාහන උපයෝජනය

-----------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ටිපර් රථයක එංජිමෙහි පැවති දෝෂ හඳුනා ගැනීමකින් තොරව වාහනයට තෙල් ලීටර් 02 බැගින් නිරන්තරව යොදා වාහනය ධාවනය කිරීමට සැලැස්වීමෙන් 2017 දෙසැම්බර් 07 දින එංජිම සම්පූර්ණයෙන් අක්‍රීය වීම නිසා, නියෝජිතායතනයෙන් රු.1,181,639 කට එංජිමක් යෙදීමට තීරණය කර තිබුණි. එසේ වුවත්, 2018 ජූලි 31 දින වනවිටත් අදාළ අලුත්වැඩියාව කර නොතිබූ අතර, ඊට අදාළ පරීක්ෂණ සිදු කර නොතිබුණි.

(ආ) ට්‍රැක්ටරයක වැඩ පත්‍රිකාවේ සඳහන් දෝෂ අලුත්වැඩියා නොකර නිර්දේශයකින් හෝ අනුමැතියකින් තොරව හුලං බැස යාමට අදාළ අලුත්වැඩියා ක්‍රියාවලිය යනුවෙන් දක්වා රු.97,000 ක් වැය කර අමතර කොටස් මිලදී ගෙන වාහනයේ අලුත්වැඩියාවට යොදාගෙන නොතිබුණි.

(ඇ) වෑන් රථයකට බ්රේක් ඔයිල් යොදා අලුත්වැඩියා කිරීමට කාර්මික නිලධාරීවරයා නිර්දේශ කර තිබිය දී, බ්රේක් පද්ධතියම ගලවා ඉවත් කර අලුත්වැඩියා කර තිබුණි. එසේ වුවත්, කි.මී.1000 ක් පමණ ධාවනය කිරීමේ දි නැවත තිරිංග පද්ධතිය අක්‍රීය වීම හේතුවෙන්, මාස 09 ක් තුළ එක් දෝෂයක් සඳහා අවස්ථා 02 කදී වැය වූ රු.69,200 ක වියදම නිශ්ඵල වියදමක් බවට පත් වී තිබුණි.

(ඇ) 2014 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලය තුළ වාහන අලුත්වැඩියා හා නඩත්තු කටයුතු සඳහා රු.169,180,822 ක් වැය කර තිබුණි. මේ සම්බන්ධව පහත කරුණු නිරීක්ෂණය විය.

(i) පසුගිය වර්ෂ 04 ක කාලය තුළ නාගරික කාර්මික වැඩපල වාහන අලුත්වැඩියාවන් සඳහා සාමාන්‍යයෙන් වර්ෂයකට රුපියල් මිලියන 42 ක් පමණ වැය කර තිබුණි. පවතින වාහන 227 පදනම් කර ගතහොත්, එක් වාහනයක් සඳහා වර්ෂයකට අලුත්වැඩියා පිරිවැය දළ වශයෙන් රු.185,022 ක් වී තිබුණි.

(ii) කාර්මික වැඩපොළ තුළින් වාහන අලුත්වැඩියා සිදු කළ ද, සමස්ත අලුත්වැඩියා වියදමෙන් එය 2015 වර්ෂයේ දී සියයට 36 ක්, 2016 වර්ෂයේ දී සියයට 13 ක් හා සමාලෝචිත වර්ෂයේ දී සියයට 19 කට අදාළව පෞද්ගලික ආයතන හරහා සිදු කිරීම නිසා, නාගරික වැඩපොළ තුළින් අපේක්ෂිත අරමුණ ප්‍රමාණවත්ව පරිදි ඉටු වී නොතිබුණි.

(iii) සභාව සතු ට්‍රැක්ටර් රථ 30 ක අලුත්වැඩියා හා නඩත්තු කටයුතු වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ දි රු.10,592,829 ක් වැයකර තිබුණු අතර, එක් රථයක් සඳහා වාර්ෂික අලුත්වැඩියා සහ නඩත්තු වියදම දළ වශයෙන් රු.350,000 ක් විය.

(ඉ) කාර්මික වැඩ ඒකකය භාර නාගරික යාන්ත්‍රික ඉංජිනේරුවරයා වාහන අලුත්වැඩියා සම්බන්ධව කිසිදු අධීක්ෂණයක් සිදුකර නොතිබුණු අතර, නියැදි පරීක්ෂණයට අනුව, කාර්මික නිලධාරී/ වැඩ මූලිකගේ නිර්දේශයකින් හා නාගරික යාන්ත්‍රික ඉංජිනේරුවරයාගේ අනුමැතියකින් හෝ නිර්දේශයකින් තොරව වාහන 23 ක් සඳහා අවස්ථා 158 කදි රු.4,691,950 ක් වැයකර අමතර කොටස් මිල දී ගෙන කාර්මිකයින් විසින් අලුත්වැඩියා සිදු කර තිබුණි.

(ඊ) වාහන අලුත්වැඩියාවේ දි ගලවා ඉවත් කරන ලද අමතර කොටස් ලේඛනගත නොකිරීම හේතුවෙන්, සමාලෝචිත වර්ෂය තුළ අමතර කොටස් මිල දී ගැනීම සඳහා දරන ලද රු.26,479,568 ක වියදම විගණනයේ දි සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

(උ) ගලවා ඉවත් කරන ලද වාහන අමතර කොටස් තොගයක් විධිමත් ටෙන්ඩර් පරිපාටි අනුගමනය කිරීමකින් තොරව 2018 පෙබරවාරි 02 දින රු.64,090 කට බාහිර පාර්ශවයකට විකුණා තිබුණි.

(ඌ) විශේෂ ව්‍යාපෘති ඒකකය සඳහා ප්‍රසම්පාදන ක්‍රියා පරිපාටියෙන් පරිබාහිරව ටිපර් රථයක් කුලි පදනම මත ලබා ගෙන 2017 පෙබරවාරි 01 දින සිට සැප්තැම්බර් 30 දින දක්වා කාලය සඳහා එකතුව රු.201,000 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(එ) වාහන අලුත්වැඩියාව සඳහා රු.611,884 ක අමතර කොටස් ගබඩාවෙන් නිකුත් කර තිබුණ ද, ඊට අදාළ වැඩ පත්‍රිකා පිළියෙල කර නොතිබුණි.

(ඒ) ට්‍රැක්ටර් ටේලරයක වැසි බාර් එක කැඩීම හා ටේලර් තට්ටුව දිරා තිබීම අලුත්වැඩියා නොකර වෙනත් අලුත්වැඩියාවන් සඳහා රු.83,100 ක් වැය කර අමතර කොටස් මිල දී ගෙන තිබුණි. එම අමතර කොටස් සවි කිරීමකින් තොරව ට්‍රැක්ටර් ට්‍රේලරය ගොහාගොඩ කසළ අංගනයේ දිරා යෑමට ඉඩ හැර තිබුණි. එසේ තිබිය දී, ට්‍රැක්ටර් ට්‍රේලරය කුණ්ඩසාලේ පිහිටි මහ නැඟුම මාර්ග ඉදිකිරීම් ආයතනයට යොමු කර අලුත්වැඩියාවක් සිදු කළ බව දක්වා රු.214,370 ක් ගෙවා තිබුණි.

(ඔ) නාගරික වැඩපළේ වාහන අලුත්වැඩියාව නිම කර අදාළ රියදුරු වෙත වාහන භාර දීමෙන් පසුව එම වාහනවල අලුත්වැඩියාවට අවශ්‍ය රු.247,226 ක් වටිනා අමතර කොටස් අවස්ථා 16 කදී ගබඩාවෙන් නිකුත් කර තිබුණි.

3.6 අවිධිමත් ගනුදෙනු

---------------------

(අ) මහනුවර ඇසළ පෙරහැරට සමගාමීව සභාවට අයත් ගැටඹේ ක්‍රීඩාංගණය හා කටුගස්තොට රාහුල විද්‍යාලයට අයත් ක්‍රීඩාංගණය 2017 ජුලි 29 දින සිට 2017 අගෝස්තු 08 දින දක්වා ඇසළ මේලා සැණකෙළි පැවැත්වීමට ඉඩකඩ ලබා දී තිබුණි. මේ සම්බන්ධව පහත කරුණු නිරීක්ෂණය විය.

(i) මහා නගර සභා ආඥා පනතේ (252 වන අධිකාරය) 227 ඡේදයට සමගාමීව 2002 අගෝස්තු 09 දිනැති අංක 1249 දරන ගැසට් පත්‍රයේ පළ කළ මහා නගර සභා අතුරු ව්‍යවස්ථාවේ III වන කොටසේ 4(ඇ) ඡේදය ප්‍රකාරව ලංසු 08 ක් ලබා ගෙන තිබුණ ද, එම ලංසු විවෘත කිරීමකින් තොරව ලංසු ඉදිරිපත් නොකළ පාර්ශවයක් වෙත ගැටඹේ ක්‍රීඩාංගණය සැණකෙළි සඳහා රු.4,000,000 කට තාවකාලිකව බදු දී තිබුණි.

(ii) රු.64,400 ක් වැයකර ජාතික පුවත්පත්වල ප්‍රසම්පාදන දැන්වීම් පළ කර ලංසු 08 ක් ලබා ගෙන තිබුණ ද, කිසිදු හේතු දැක්වීමකින් තොරව අදාළ ලංසු විවෘත නොකර එම ලංසුකරුවන්ට ආපසු භාර දී තිබුණි.

(iii) අක්කර 02 යි රූඩ් 01 පර්චස් 35 ක් වූ කටුගස්තොට රාහුල විද්‍යාලයීය ක්‍රීඩාංගණය විධිමත් ප්‍රසම්පාදන පරිපාටිය අනුගමනය කර රු.8,542,300 කට බදු දී තිබුණ ද, අක්කර 2.5 ක් වූ ගැටඹේ නාගරික ක්‍රීඩාංගණය එම කාලපරිච්ඡේදය සඳහා ප්‍රසම්පාදන පරිපාටියෙන් තොරව රු.4,000,000 කට මහනුවර පදිංචිකරුවෙකුට බදු දී තිබුණි. ඒ අනුව, විධිමත් ප්‍රසම්පාදන පරිපාටිය අනුගමනය නොකර බදු දීම හේතුවෙන්, දළ වශයෙන් රු.4,542,300 ක් සභා අරමුදලට අලාභ සිදුවී තිබුණි.

(ආ) අස්ගිරිය පංචකර්ම මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩල ආහාර වියදම් සඳහා අනුමැතියකින් තොරව මාසිකව රු.6,000 ක් බැගින් සමාලෝචිත වර්ෂය තුළ දී, රු.72,000 ක් වැය කර තිබුණි.

(ඇ) මධ්‍යම පළාත් ආණ්ඩුකාරවරයාගේ අනුමැතියට යටත්ව පංචකර්ම ආයුර්වේද මධ්‍යස්ථානයේ මාසික ආදායමෙන් සියයට 25 ක් දිරි දීමනා ගෙවීමට සැලසුම් කර තිබුණ ද, එවැනි අනුමැතියකින් තොරව 2014 අගෝස්තු සිට 2017 ජුනි දක්වා කාලපරිච්ඡේදයට නිලධාරීන් හා සේවකයින්ට දිරි දීමනා ගෙවීම සඳහා රු.959,602 ක් වැය කර තිබුණි.

(ඈ) හදිසි අවස්ථාවක දී රු.25,000 ක් දක්වා වාහන අමතර කොටස් මිල දී ගෙන අලුත්වැඩියා කිරීම සඳහා යාන්ත්‍රික ඉංජිනේරුවරයාට බලය පවරා තිබුණ ද, එකී බලතලවලට පරිබාහිරිව කිසිදු හදිසි තත්ත්වයකින් තොරව රු.30,000 සිට රු.268,115 ක් දක්වා වූ වාහන අමතර කොටස් යාන්ත්‍රික ඉංජිනේරුවරයා යටතේ පවතින කාර්මික වැඩ පළේ වැඩ පරිපාලක විසින් මිල දී ගෙන තිබුණි. නියැදි පරීක්ෂාව අනුව, අධිකාරී බලයකින් තොරව අවස්ථා 50 කදී රු.3,818,078 ක් වූ වාහන අමතර කොටස් සමාලෝචිත වර්ෂය තුළ මිල දී ගෙන තිබුණි.

(ඉ) සභාවට අයත් පර්චස් 12.875 ක ඉඩම් කැබැල්ලක් ඉඩම් අංශයේ ප්‍රධානියා ලෙස සේවය කළ නිලධාරියෙකු විසින් ඔහුගේ භාර්යාව නමින් බදු දී තිබුණි. පසුව මෙම ඉඩම භුක්ති විඳින බව ඇය විසින් සභාවට කරන ලද ප්‍රකාශයක් මත ඉඩම ඇය වෙත පවරා දීමට කටයුතු කරමින් පැවතුණි. එසේම, මධ්‍යම පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය ප්‍රකාරව බදු පැවරීමේ දී බදු හා ගාස්තු වශයෙන් රු.6,198,500 ක් අය කර ගත යුතු වුවත්, ඊට පටහැනිව රු.2,486,000 ක් අය කරන බව බදුකාරිය වෙත ලිඛිතව දන්වා තිබුණි.

3.7 ප්‍රසම්පාදනය

---------------

3.7.1 සැපයීම් හා සේවා

--------------------

(අ) සිමෙන්ති මිටි 10,000 ක් මිල දී ගැනීම සඳහා ඉදිරිපත් කර තිබුණු වැට් රහිත රු.752.17 ක් වූ අඩුම මිල ගණන් සැලකීමකින් තොරව රු.782.61 ක් වූ ඊට වඩා වැඩි මිල ගණන් ඉදිරිපත් කර තිබූ ආයතනයෙන් සිමෙන්ති මිටි 10,800 ක් මිල දී ගැනීම හේතුවෙන්, සභා අරමුදලට රු.378,000 ක පාඩුවක් සිදු කර තිබුණි. එසේම, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.18(අ) හා (ආ) වගන්ති ප්‍රකාරව වැට් බද්ද වෙන් වශයෙන් සඳහන් කරන ලෙස ලංසුකරුවන්ට උපදෙස් ලබා දී නොතිබුණු අතර, ලංසු ඇගයීමේ දී ඉදිරිපත් කර තිබූ ආයතන 03 න් ආයතන 02 ක මිල ගණන්වලට වැට් එකතු කර ඇගයීම් සිදු කර තිබුණි.

(ආ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.1(ආ), 6.1.4 හා 5.6.1(අ) මාර්ගෝපදේශවලට පටහැනිව වෙළඳපල තත්ත්වයන්ට ගැළපෙන පිරිවිතර සකස් කිරීමකින් තොරව හා දෙපාර්තමේන්තු පිරිවිතරවලට පරිබාහිරව රු.2,632,260 ක් වටිනා වානේ කබඩ් 38 ක් මිලදී ගෙන තිබුණි.

(ඇ) මහනුවර නගරයේ වීථිවල නවත්වන රථ වාහනවලින් ඉලෙක්ට්‍රොනික් මාධ්‍ය භාවිතා කරමින් ගාස්තු අය කිරීමේ සේවාවක් නිර්මාණය කිරීම හා එය ක්‍රියාත්මක කර ආදායම් රැස් කිරීමේ තාවකාලික බදු අයිතිය 2017 මාර්තු 01 දින සිට 2019 පෙබරවාරි 28 දින දක්වා වර්ෂ 02 ක කාලයක් සඳහා රු.63,500,000 කට (රජයේ බදු රහිතව) පෞද්ගලික ආයතනයකට පවරා 2017 අප්‍රේල් 05 දින ගිවිසුම්ගත වී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු අනාවරණය විය.

(i) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.1(අ) ඡේදයේ හා 2003 සැප්තැම්බර් 05 දිනැති අංක 1304/ 18 දරන ගැසට් පත්‍රයේ පළ කළ මහා නගර සභා අතුරු ව්‍යවස්ථාවේ III වන කොටසේ 5(එ) ඡේදයේ විධිවිධානවලට අනුව, ලංසු කැඳවීමේ ලියවිලිවල හා සිංහල හා දෙමළ පුවත්පත්වල පළ කරන ලද ලංසු ආරාධනාවල “ලියාපදිංචි තැපෑලෙන්” ලංසු ඉදිරිපත් කළ යුතු බව දක්වා නොතිබුණි.

(ii) ලංසු ඉදිරිපත් කරන ආයතන විසින් මෘදුකාංගයේ (Photo type) ප්‍රදර්ශනයන් කළ යුතු බවට කොන්දේසියක් අදාළ ලංසු ලියවිලිවල ඇතුළත් කර නොතිබුණි.

(iii) තෝරා ගත් ලංසුකරු විසින් අදාළ සුදුසුකම් සපුරා ඇති බව සනාථ කිරීමට ලිඛිත සාක්ෂි ලබා දි නොතිබූ අතර, ලංසු කැඳවීමේ ලේඛන අනුව, 2016 දෙසැම්බර් 08 දින තාක්ෂණික ලංසු ලියවිලි විවෘත කරන බව දක්වා 2016 දෙසැම්බර් 09 දින තාක්ෂණික ලංසුව විවෘත කර තාක්ෂණික වාර්තාවක් ලබා දී තිබුණි. එසේම, එදින තාක්ෂණික සුදුසුකම් සහිත වගකිව යුතු නිලධාරියෙකු එම කමිටුවට සහභාගී වී නොතිබුණි.

(iv) සභාව විසින් තෝරා ගත් ලංසුකරු සමඟ ගිවිසුම්ගත වීමකින් තොරව 2017 පෙබරවාරි 22 දින සිට 2017 මාර්තු 31 දින දක්වා සාමාන්‍ය ක්‍රමවේදය පරිදි ලදුපත් නිකුත් කර රථ වාහනවලින් ගාස්තු අය කිරීමේ තාවකාලික බදු අයිතියක් ලබා දි තිබුණි.

(v) කාර්යසාධන සුරක්ෂණය රාජ්‍ය බැංකුවකින් ලබා ගෙන ඉදිරිපත් කළ යුතු බවට විධිවිධාන තිබිය දී, බදුකරු විසින් පෞද්ගලික බැංකුවකින් ලබා ගෙන ඉදිරිපත් කළ කාර්යසාධන සුරක්ෂණය පිළිගෙන තිබුණි.

(vi) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8(අ) ඡේදයේ සඳහන් පරිදි කාර්යසාධන සුරක්ෂණය ලංසු මුදලින් සියයට 05 කට නොඅඩු විය යුතු බව සඳහන්ව තිබුණ ද, එම කොන්දේසිවලට පටහැනිව සභාව විසින් කාර්යසාධන සුරක්ෂණය කොන්ත්‍රාත් මුදලින් සියයට 100 ක් ලෙස ලබා දිය යුතු බව ලංසු ලියවිලිවල දක්වා තිබුණි.

(vii) වාහන ගාල් කිරීමේ දී, අය කරනු ලබන මුදල් පිළිබඳව හෝ වෙනත් ගැටළුවක් පැන නැඟුනහොත්, හෝ ආරවුලක් ඇති වුවහොත් ඒ සඳහා සභාව වගකියනු නොලබන බව ලංසු ලේඛනවල දක්වා තිබීමෙන්, මහජනයාට යම් අගතියක් සිදු වීමට ඉඩකඩ සලසා තිබුණි.

3.7.2 කොන්ත්‍රාත් පරිපාලනය
---------------------------

(අ) මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතියේ අරමුදල් හා සභා අරමුදල් මඟින් ඇහැලේපොළ කුමාරිහාමි මාවතේ සති පොළ හා එම භූමියේ අමානෝ තහඩු ආවරණයක් සැකසීම සඳහා කොන්ත්‍රාත් ආයතනයක් සමඟ රු.8,571,000 ක වටිනාකමට ගිවිසුම්ගත වී රු.1,714,175 ක අත්තිකාරම් ගෙවා තිබුණි. මේ සම්බන්ධව පහත කරුණු නිරීක්ෂණය විය.

(i) වහල සහිත ආවරණයක් ඉදිකිරීම නුසුදුසු බව නාගරික සංවර්ධන අධිකාරිය නිර්දේශ කර තිබිය දී, ඒ පිළිබඳව සලකා බැලීමකින් තොරව වහල සහිත ආවරණය ඉදිකිරීමට රු.5,298,048 ක් සභා අරමුදලින් වැය කිරීමට තීරණය කර තිබුණි.

(ii) 2017 මාර්තු 28 දින හෝ ඊට පෙර කොන්ත්‍රාත්තුව අවසන් කර භාර දීමට ගිවිස ගෙන තිබුණ ද, 2017 සැප්තැම්බර් 21 දින වන විට කොන්ත්‍රාත්තුවෙන් ප්‍රමාණාත්මක වැඩ කොටසක් ඉටු කර නොතිබුණු අතර, ඒ පිළිබඳ කිසිදු අධීක්ෂණයක් සිදු කර නොතිබුණි. 2017 අප්‍රේල් 16 දින වන විට අදාළ කොන්ත්‍රාත්තුවේ කාර්යසාධන ඇපකරය හා අත්තිකාරම් ඇපකරවල කාලය අවසන්ව තිබිය දී, ඇපකරවල කාලය දීර්ඝ කරවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iii) 2017 සැප්තැම්බර් 27 දින කරන ලද භෞතික පරීක්ෂාවේ දී පහත කරුණු අනාවරණය විය.

a. සති පොළෙහි වහලය ඉදිකිරීම සඳහා මීටර් 2.5 ක උසකින් යුක්තව මීටර් 3 න් 3 ට මිලි මීටර් 75 GI බට ඉදිකර තිබූ අතර, එම GI බට ඉදි කළ ආකාරය අනුව සැලසුම්වල සඳහන් පරිදි වක්‍රාකාර හැඩයෙන් යුතු වහලක් ඉදිකිරීමේ හැකියාවක් නොපැවතුණි. මේ ආකාරයේ GI බට 41 ක් ඉදිකර තිබූ අතර, 2018 ජූලි 31 දින වන විටත් මෙහි වැඩ අවසන් කර නොතිබුණි.

b. නාගරික ඉංජිනේරුවරයා විසින් 2017 මාර්තු 11 දින පිළියෙළ කරන ලද ඇස්තමේන්තුවට වැඩ විෂයය අංක 03 යටතේ පස් හැරීම සඳහා 2/252.00 m x 0.20 m x 0.45 m ප්‍රමාණයේ සමන්විත ඝන මීටර් 45.36 ක් ඇතුළත් කර ඇතත්, එවැනි පස් කැපීමක් නිරීක්ෂණය නොවුණි.

(ආ) රජපිහිල්ල මාවතේ නැරඹුම් ස්ථානය අසළ මි.මී.200 ජල නළ පද්ධතිය වෙනස් කිරීමේ කර්මාන්තයේ වැඩ 2017 ජුනි 10 දින ආරම්භ කර 2017 ඔක්තෝබර් වන විට අතර මඟ නවතා දමා තිබුණු අතර, දළ වශයෙන් රු.2,077,337 ක් වියදම් දරා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) මහනුවර දුනුමඩලාව ජලාශයෙන් අම්පිටිය ප්‍රදේශයට හා මහනුවර නගරයට ජලය බෙදා හරින සාර්ථකව පවතින එම ජල නළ පද්ධතිය වෙනස් කිරීමේ අවශ්‍යතාවය පැහැදිලි නොවූ අතර, යථෝක්ත ජල නළ පද්ධතිය වෙනස් කිරීමෙන් 2017 ඔක්තෝබර් 26 දින වන විට සභා අරමුදලට රු.2,077,337 ක පාඩුවක්ව සිදුව තිබුණි.

(ii) යථෝක්ත ජල නළ පද්ධතිය වෙනස් කිරීමේ ව්‍යාපෘතිය සම්බන්ධව ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර නොතිබූ අතර, ඉදිකිරීම් ආරම්භ කිරීමට ප්‍රථම දළ සැලසුම් හෝ ද්‍රව්‍ය, ශ්‍රම ඇස්තමේන්තු පිළියෙල කිරීමට හෝ සභාවේ විධිමත් පූර්ව අනුමැතියක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iii) සෘජු ශ්‍රමය භාවිතා කර ක්‍රියාත්මක කර තිබුණු ව්‍යාපෘතියේ ජල නළ උපාංගවල ආරක්ෂාව සම්බන්ධව අධීක්ෂණ නිලධාරීන්ගේ විධිමත් අධීක්ෂණයක් නොමැති වීම හේතුවෙන් රු.220,520 ක් වටිනා ජල නළ උපාංග 11 ක් ව්‍යාපෘති භූමියේ දී අස්ථානගත වී තිබුණි.

(iv) 2017 නොවැම්බර් 15 දින කරන ලද භෞතික පරීක්ෂාවට අනුව, මි.මී.300 ප්‍රමාණයේ විශ්කම්භයක් සහිත ජල නළවලින් රැගෙන එන ජලය මි.මී.200 විශ්කම්භයකින්යුත් නළයකට සම්බන්ධ කර නැරඹුම් ස්ථානය වටා මීටර් 80 ක් ගමන් කර නැවත මි.මී.300 නළයකට සම්බන්ධ කිරීම හේතුවෙන් ඇති වන පීඩනයෙන් ජල නළවලට හානි වීමේ ඉඩකඩක් පැවතුණි.

(ඇ) සභා අරමුදල් යටතේ රු.2,047,766 කට ඇස්තමේන්තු කර සෘජු ශ්‍රම පදනම මත R3 පොම්පාගාරය වටා වැට ඉදිකිරීමේ කර්මාන්තයේ ඇස්තමේන්තුව අනුව, අත්තිවාරම කොන්ක්‍රීට්වලින් ඉදි කළ යුතු වුවත්, අනුමැතියකින් හා ඇස්තමේන්තු සංශෝධනයකින් තොරව කළු ගල් අත්තිවාරම් බැම්මක් ඉදි කර තිබුණි. ඉදි කළ යුතු chaink link වැටෙහි දැළ සවි කිරීමට තිරස් අතට ¾" GI බට යෙදිය යුතු වුවත්, අත්තිවාරම් මත කොන්ක්‍රීට් යොදා දැළ පහළට සම්බන්ධ කර තිබුණි.

(ඈ) අවශ්‍යතාවයක් හා ලිඛිත අනුමැතියක් නොමැතිව වැඩ අධිකාරීවරයාගේ වාචික උපදෙස් අනුව, R 3 පොම්පාගාරයේ ආරක්ෂිත ගල් බැම්මක් ඉදිකර තිබුණි. මීට වැය වූ මුදල් හඳුනා ගැනීමට හැකි වන පරිදි ලිපි ලේඛන නඩත්තු කර නොතිබුණි. එසේම, කළු ගල් බැම්ම ඉදිකිරීම සඳහා 6"x9" ප්‍රමාණයට වඩා විශාල ප්‍රමාණයේ ගල් භාවිතා කර තිබූ අතර, බැම්ම ඉදිකිරීමට යොදා ගෙන තිබූ වැලි සිමෙන්ති සහිත බදාම මිශ්‍රණය දුර්වල මට්ටමක පැවතුණි. මේ සඳහා වගකිව යුතු නිලධාරියෙකු පරීක්ෂා කර නිමවුම් වාර්තාවක් සකස් කර නොතිබුණි.

(ඉ) ජල කර්මාන්ත දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කර තිබූ රු.31,056,543 ක් වටිනා සංවර්ධන ව්‍යාපෘති 33 කට අදාළ වැඩ පත්‍රිකා සහිත ලිපිගොනු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

----------------------------------------

අයවැය පාලනය

-------------------

(අ) සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛනයට අනුව, ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමග සැසඳීමේ දී ආදායම් විෂයයන් 02 ක සියයට 14 සිට සියයට 27 දක්වා ද, වියදම් විෂයයන් 04 ක සියයට 16 සිට සියයට 67 ක් දක්වා ද විචලනයක් නිරීක්ෂණය වූ බැවින්, අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

(ආ) 2014 මාර්තු 20 දිනැති අංක 2014/02 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 09 ඡේදය ප්‍රකාරව සම්මත වූ අයවැය ලේඛනයට අනුව, වර්ෂය තුළ මූල්‍ය කටයුතු පාලනය කර ගත යුතු වුවත්, පුනරාවර්තන හා ප්‍රාග්ධන වැය විෂයයන් 40 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන ඉක්මවා එකතුව රු.114,938,913 ක් වැය කර තිබුණි.

(ඈ) වියදම් සම්බන්ධයෙන් ත්‍රෛයිමාසිකව අයවැය විමර්ෂණයක් නොකිරීම හේතුවෙන් වැය විෂයයන් 47 ක ප්‍රතිපාදන ඉක්මවා එකතුව රු.12,101,000 ක වියදම් දැරීමෙන් පසු වැය මාරු කර පසුව අනුමැතිය ලබාගෙන තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ දී ප්‍රාග්ධන වැය විෂයයන් 16 ක් වෙනුවෙන් වෙන් කර තිබූ රු.20,992,014 ක ප්‍රතිපාදන සියයට 75 සිට සියයට සියයක් දක්වා පරාසයක් තුළ උපයෝජනය කර නොතිබුණි.

(ඉ) වෙන් කර තිබූ ප්‍රතිපාදන ඉක්මවීම් සිදු වන අවස්ථාවලදීම ඒ පිළිබඳව හඳුනා ගැනීමකින් තොරව වැය විෂයයන් 169 ක් සඳහා රු.137,846,000 ක සමස්ත වැය මාරුවක් ලෙස අයදුම්පත් ඉදිරිපත් කර 2017 දෙසැම්බර් 29 දින අනුමැතිය ලබා ගෙන තිබුණි. මෙහිදි කුමන වැය විෂයයකින්, කුමන වැය විෂයයකට ප්‍රතිපාදන හුවමාරු වන්නේ ද, පිළිබඳව වෙන් වෙන්ව දක්වා නොතිබුණි.

(ඊ) ආයුර්වේද බෙහෙත් ශාලාවලට අවශ්‍ය බෙහෙත් ද්‍රව්‍ය නිශ්චිතව හඳුනා ගැනීමකින් තොරව හා ඊට අදාළ ඇස්තමේන්තු පිළියෙල කිරීමකින් තොරව වැය විෂයයන් 02 ක් සඳහා දළ අගයක් ලෙස රු.4,500,000 ක ප්‍රතිපාදන සලසා ගෙන එයින් රු.2,865,348 ක් ඉතිරි කර තිබුණි.

(උ) සංවර්ධන කටයුතු වෙනුවෙන් වූ වැය විෂයයන් 06 ක් සඳහා වෙන් කර තිබූ රුපියල් මිලියන 127 ක ප්‍රතිපාදනයෙන් රුපියල් මිලියන 118 ක් අපේක්ෂිත අරමුණුවලට උපයෝජනයෙන් තොරව වෙනත් ප්‍රාග්ධන වැය විෂයයන්ට මාරු කර තිබුණි. එසේම, ප්‍රාග්ධන වැය විෂයයන් 02 ක් සඳහා වූ රුපියල් මිලියන 2.94 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලනය

-----------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර, පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධතිය | අඩුපාඩුව |
|---|---|---|
| (අ) | ආදායම් පරිපාලනය | (i) හිඟ ආදායම් අය නොකිරීම |
| | | (ii) බදු ගිවිසුම් අත්සන් නොකිරීම |
| | | (iii) බදු ගිවිසුම් අලුත් නොකිරීම |
| (ආ) | ගිණුම්කරණය | (i) ගිණුම් පොත් පත් හා ලේඛන යාවත්කාලීනව නොපැවැත්වීම |
| | | (ii) පොදු ලෙජරයේ සියලු ගිණුම් ඇතුළත් නොකිරීම |
| (ඇ) | වත්කම්/ දේපළ | (i) ආරක්ෂාව තහවුරු නොකිරීම |
| | | (ii) කාලීනව අපහරණය නොකිරීම |
| (ඈ) | තොග පාලනය | (i) අවිධිමත් තොග පාලනය |
| | | (ii) තොග ලෙජරය යාවත්කාලීනව නඩත්තු නොකිරීම |
| | | (iii) විධිමත් සමීක්ෂණ නොපැවැත්වීම |
| (ඉ) | ණයගැති/ ණයහිමි | (i) උපලේඛන නිවැරදි නොවීම |
| | | (ii) කාල විශ්ලේෂණ පිළියෙල නොකිරීම |
| | | (iii) ණයගැති හා ණයහිමි නිරවුල් නොකිරීම |
| (ඊ) | ව්‍යාපෘති/ කොන්ත්‍රාත් | (i) ඇස්තමේන්තු පිළියෙල නොකිරීම |
| | | (ii) වැඩ පත්‍රිකා නිසි පරිදි නඩත්තු නොකිරීම |
| | | (iii) ප්‍රමාණවත් අධීක්ෂණයක් නොමැතිවීම |